## පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/148 /2017 (NPC)

එම්.සී.ඩී.වික්‍රමසිංහ
**අභියාචක**
**එදිරිව**
ජාතික පොලිස් කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය :-2026.01.27**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

**-<u>නියෝගය</u>-**

**විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා**

අභියාචක වන එම්.සී.ඩී.වික්‍රමසිංහ යන අය විසින්, 2017.06.28 දිනැතිව මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කර ඇති අභියාචනා පෙත්සම මගින් ඉල්ලා ඇත්තේ, ඇය වෙත පැනවූ විනය නියෝගය අවලංගු කර දෙන ලෙසයි. එකී විනය නියෝගය අභියාචනා පෙත්සම සමඟ ඇමුණුම් 01 ලෙසට සළකුණු කර ඉදිරිපත් කර ඇත. එම විනය නියෝගයට අනුව, එවකට මධ්‍යම පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ගාමිණී දිසානායක යන අය විසින් අභියාචකගේ එක් වැටුප් වර්ධකයක් වසරකින් විලම්භනය කිරීමට නියෝග කර, ඇයගෙන් රුපියල් තිස්දහසක (රු.30,000/=) මුදලක් අයකර ගැනීමටත් නියම කර ඇත. ඉහත මුදල් අයකර ගැනීම, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 29/11 අනුව නියම කර තිබූ අතර, එකී චක්‍රලේඛනය පසු කාලීනව අවලංගු කර ඇති බැවින්, එම නියෝගය ක්‍රියාත්මක වන්නේ නැත.

අභියාචක වෙත පනවා තිබූ ඉහත කී විනය නියෝගයට එරෙහිව අභියාචක විසින් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කර තිබූ අතර, එකී අභියාචනය නිශ්ප්‍රභ කරමින් ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ඇය වෙත එවන ලද, 2017.05.03 දිනැති ලිපියෙන්

කොමිෂන් සභා තීරණය ඇයට දැනුම් දී ඇත. මෙම අභියාචනය ඉදිරිපත් කර ඇත්තේ, ඉහත කී ජාතික පොලිස් කොමිෂන් සභාවේ තීරණය අවලංගු කරවා ගැනීමටත්, ඇය වෙත නිකුත් කර ඇති විනය නියෝගය අවලංගු කරවා ගැනීම සඳහාත් ය.

ඉහත කී විනය නියෝගය පනවා ඇත්තේ, අභියාචකට එරෙහිව පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණයෙන් අනතුරුව නිකුත් කරන ලද වාර්තාවක් සළකා බැලීමෙන් අනතුරුවය. විධිමත් විනය පරීක්ෂණයේ තීරණය වූයේ අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ 01, 02 සහ 03 චෝදනා සනාථ වී ඇති බවත්, 04 වන චෝදනාව සනාථ නොවූ බවත්ය.

ඉදිරිපත් කර තිබූ චෝදනා වන්නේ, රාජකාරිය පැහැර හැරීම, බොරුකීම සහ/හෝ ඇත්ත සඟවා කතා කිරීම යන චෝදනාවන් ය. එම චෝදනා තුන ඉදිරිපත් කිරීමට හේතු වී ඇත්තේ, අභියාචක කුණ්ඩසාලේ පොලිස් රෝහලට අනුයුක්තව, එහි ස්ථානාධිපති සුභ සාධක වශයෙන් සේවය කරන අවධියේ දී, කුණ්ඩසාලේ පොලිස් රෝහලේ දෛනික පොත් වල සඳහන් කර ඇති විස්තර, එම දිනවලට අදාළ මාසික සහ දෛනික වාර්තාවන්හි වැරදි සහගත සහ අසත්‍ය ලෙස පිළියෙල කර, කුණ්ඩසාල පොලිස් රෝහලේ ස්ථානාධිපති මඟින්, අධ්‍යක්ෂක වෛද්‍ය සේවා කොට්ඨාශය වෙත ඉදිරිපත් කර තිබීමයි.

ඉහත කී කරුණු සනාථ කිරීම සඳහා පැමිණිලි පාර්ශවය වෙනුවෙන් සාක්ෂිකරුවන් නව දෙනෙකු මඟින් සාක්ෂි ඉදිරිපත් කර ඇති අතර, අභියාචක ද ඇය වෙනුවෙන් සාක්ෂි ඉදිරිපත් කර ඇත. එච්.එම්.සුනිල් බණ්ඩාර යන අය සක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ, ඔහු මෙම කරුණට අදාළව කිසිදු වාර්තාවක් සකස් නොකල බවයි. හේමන්ත වීරතුංග යන අය සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ, මෙම කරුණ සම්බන්ධයෙන් වෛද්‍ය කොට්ඨාශ අධ්‍යක්ෂක විසින් පවත්වන ලද පරීක්ෂණයකදී ඉදිරිපත් කරන ලද වාර්තාවල පරස්පරතාවයක් ඇති වූ බවට අනාවරණය වූ බව පමණකි. ඉතිරි සාක්ෂිකරුවන් වන සෙනරත් බණ්ඩාර වීරසේකර, ගුණපාලගේ ගුණරත්න, ධම්මික ප්‍රියංක වීරසේකර, ජයරත්න බණ්ඩා, ශ්‍රියානි පද්මසිරි යන අය පවසා ඇත්තේ, සිද්ධිය පිළිබඳව පවත්වන ලද පරීක්ෂණයකින් අනතුරුව, වැරදි වාර්තා ඉදිරිපත් කර තිබූ බවට අනාවරණය වී තිබූ බවයි.

චෝදනාවන්හි සඳහන් කරන ලද වැරදි සහගත යැයි කියනු ලබන වාර්තාව, සාක්ෂිකරුවන්ගේ පරීක්ෂාවට හෝ දැනුමට ලක්වූ බවට කිසිදු

සාක්ෂියක් ඉදිරිපත් නොවේ. නමුත් සියළු චෝදනා රඳා පවතින්නේ වැරදි සහගත වාර්තාවක් ඉදිරිපත් කිරීම මතය. එම වාර්තාව විධිමත් විනය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වී නැත.

සහකාර පොලිස් අධිකාරී සරත් විජේසිරි ජයලත් යන අය ද විධිමත් විනය පරීක්ෂණයේ දී සාක්ෂි ලබා දී ඇතත්, ඔහුගේ සාක්ෂියෙහි සම්පිණ්ඩනයක් පරීක්ෂණය පැවැත්වූ නිලධාරියාගේ වාර්තාවෙහි දක්නට නැත. කෙසේ නමුත්, විජේසිරි ජයලත් යන අය සාක්ෂි දෙමින් පවසා ඇත්තේ, මේ සම්බන්ධයෙන් ඔහු විසින් පරීක්ෂණයක් පැවැත්වූ බවත්, එම පරීක්ෂණ වාර්තාව වෛද්‍ය සේවා කොට්ඨාශයේ අධ්‍යක්ෂකතුමා වෙත ඔහුගේ නිරීක්ෂණ සහ නිගමනද ඇතුළත් කරමින් ඉදිරිපත් කළ බවයි. එම වාර්තාව මූලික විමර්ශන ගොනුවේ, පිටු 31 සිට 43 දක්වා ඇතුළත් කර ඇති බවටත් ඔහු වැඩිදුරටත් සාක්ෂි දී ඇත. ඔහු විසින් සඳහන් කර ඇති පිටු 31 සිට 43 ඇතුළත් වාර්තාව කෙරෙහි ද මෙම විනිශ්චය අධිකාරයේ අවධානය යොමු කරන ලදි.

නමුත් ඉහත කී කිසිදු සාක්ෂියක් මඟින් වෛද්‍ය සේවා අධ්‍යක්ෂක වෙත ඉදිරිපත් කර ඇතැයි කියනු ලබන දෝෂ සහිත වාර්තාව, විධිමත් විනය පරීක්ෂණයේ දී සාක්ෂි ලෙස ඉදිරිපත් කර නැත. වෛද්‍ය සේවා කොට්ඨාශයේ අධ්‍යක්ෂකවරයා හෝ සාක්ෂි දීමට පැමිණ නැත. එකී වැරදි සහගතයැයි කියනු ලබන වාර්තාව, වෛද්‍ය සේවා කොට්ඨාශය වෙත ඉදිරිපත් කර තිබුණේ නම්, එම වාර්තාව සාක්ෂි ලෙස ඉදිරිපත් කළ යුතුව තිබුණි. නමුත් එකී වාර්තාව සාක්ෂියට ඉදිරිපත් නොකර, එම වාර්තාව වැරදි සහගත ලෙස පිළියෙල කළා යැයි කියනු ලබන කරුණ ඔප්පු කිරීමට හැකියාවක් ලැබෙන්නේ නැත. මෙම කරුණ, විනිශ්චය අධිකාරය ඉදිරියේදී මෙම අභියාචනය විභාගයට ගත් අවස්ථාවේ දී පවා මතුවූ අතර, එම වාර්තාව ඉදිරිපත් කිරීමට ජාතික පොලිස් කොමිෂන් සභාව වෙතට දැනුම් දෙන ලදි. ඔවුන්ද දන්වා සිටියේ එම වාර්තාව විධිමත් විනය පරීක්ෂණයේ දී සළකුණු කර ඉදිරිපත් කර නොමැති බවයි.

ඉහත කී හේතූන් අනුව පෙනී යන්නේ ඉදිරිපත් කර තිබූ චෝදනාවෙහි සඳහන් වැරදි සහගත යැයි කියනු ලබන වාර්තාව, සාක්ෂියට ඉදිරිපත් කර නොමැති බවයි. ඒ අනුව එම වාර්තාව නොමැතිව, එකී චෝදනා සනාථ වී ඇතැයි යනුවෙන් ගෙන ඇති තීරණය වැරදි සහගතය. ඒ අනුව අභියාචක වෙත නිකුත් කර ඇති විනය නියෝගය සඳහා පදනම් කරගෙන ඇති, විනය පරීක්ෂණය පැවැත්වූ නිලධාරියාගේ තීරණය දෝෂ

සහගත වන්නේ නම්, එකී විනය නියෝගය ඒ අකාරයෙන් පවත්වා ගෙන යාමට හැකි වන්නේ නැත.

එම කරුණු සළකා බලා, ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අභියාචක වෙත නිකුත් කර ඇති තීරණය සහ එම තීරණය මත ක්‍රියා කරමින්, මධ්‍යම පළාත භාර ජ්‍යෙෂ්ඨ පොලිස්පතිවරයා විසින් නිකුත් කර ඇති තීරණය යන තීරණයන් දෙකම අවලංගු කර නිශ්ප්‍රභ කරමු.

ඒ අනුව අභියාචක වෙත පනවා ඇති දඬුවමද ඉවත් විය යුතු බවට තවදුරටත් නියෝග කරමු.

මෙම නියෝගය ක්‍රියාත්මක කිරීමට ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත නියෝග කරමු.

ඉහත කී කරුණු සළකා බලා, අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනයට ඉඩදෙමු.

අභියාචනයට ඉඩදෙමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-